**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ ( පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) අදියර II - 2014**

---

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ ( පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) අදියර II හි 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය (ජා.ස.ජ.නි.) සහ ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර.) අතර 2001 පෙබරවාරි 20 දින එළඹි ගිවිසුම යටතේ පිටත වටරවුම් මහාමාර්ගයේ සිට කොළඹ නගරයට විස්තරාත්මක සැලසුම් අධ්‍යයනයක් සඳහා ලද රු. මිලියන 417 කට සමාන ජපන්යෙන් මිලියන 580 ක ප්‍රදාන වටිනාකමකින් මෙම ව්‍යාපෘතිය ඇරඹිණි. තවද, වර්තමානයේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය, (ජා.ස.ජ.නි.) එවකට ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව සහ ශ්‍රී ලං ර සමඟ 2007 මාර්තු 28 දින ව්‍යාපෘතියේ අදියර I යටතේ කොට්ටාව සිට කඩුවෙල දක්වා මහාමාර්ග කිලෝමීටර 12 ක් ඉදිකිරීමට අංක එස්එල්-පී 89 දරන පළමු ණය ගිවිසුමට එළඹී තිබුණි. ව්‍යාපෘතියේ අදියර II යටතේ කඩුවෙල සිට කඩවත දක්වා මහමාර්ග කිලෝමීටර 8 ක් ඉදිකිරීමට 2008 ජූලි 29 දින එස්එල්-පී 91 දරන දෙවන ණය ගිවිසුමට එළඹී තිබුණු අතර 2011 මාර්තු 22 දින අංක එස්එල්පී 101 දරන තුන්වන ණය ගිවිසුමට එළඹී තිබුණි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ ( පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) අදියර II හි ණය ගිවිසුම් අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ නාගරික ප්‍රදේශයේ වාහන තදබදය අවම කිරීමට හැකිවන පරිදි දක්ෂිණ අධිවේගය හා කොළඹ නගරයේ සිට විහිදෙන අනෙකුත් ජාතික මාර්ග සමග සම්බන්ධ වන කොළඹට මායිම්ව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම හා එමඟින් රටේ අනෙකුත් ප්‍රදේශ සමඟ සම්බන්ධතාවය පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ණය ගිවිසුම් අනුව, අදියර II ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 49,000 කට සමාන ජපන්යෙන් මිලියන 44,097 ක් වූ අතර ඉන් රු. මිලියන 29,319 කට සමාන ජපන්යෙන් මිලියන 37,406 ක් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. අදියර II යටතේ මහමාර්ගයේ ඉදිකිරීම් 2008 මැයි මාසයේදී ආරම්භ කිරීමට නියමිත වූ අතර 2012 අප්‍රේල් වන විට මාස 48 ක් ඇතුළත අවසන් කිරීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත් අදියර II යටතේ මහාමාර්ග ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2009 ඔක්තෝබර් 22 දින කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණු අතර 2015 ජූලි මාසයේදී නිම කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඉ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 නොසැසඳු පාලන ගිණුම්

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ පවත්වා ගනු ලැබූ අන්තර් ජංගම ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට රු. 40,016,302 ක ගෙවිය යුතු ශේෂයක් දක්වා තිබුණි. කෙසේ වෙතත් ඊට අනුරූපීව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවත්වා ගනු ලැබූ අන්තර් ජංගම ගිණුමේ එදිනට ශේෂය රු. 48,620,225 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ අන්තර් ජංගම ගිණුමේ පෙන්නුම් කළ රු. 646,654,827 ක ශේෂය මෙම ව්‍යාපෘතිය සඳහා පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතියේ - අදියර 1 විසින් ඊට අනුරූපීව පවත්වා ගනු ලැබූ අන්තර් ජංගම ගිණුමේ රු. 676,085,438 ක ශේෂය සමඟ එකඟ වී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් වල මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) |
| ජා.ස.ජ.නි. | | | | | | | |
| ණය අංක-91 | 5,718 | 5,757 | - | - | - | - | - |
| ණය අංක-101 | 31,688 | 23,562 | 13,872.0 | 95.34 | 12,394.11 | 259.07 | 33,679.69 |
| ශ්‍රී.ලං.ර | 6,691 | 19,681 | 89.2 | 0.64 | 82.61 | 9.56 | 1,243.36 |
| | **44,097** | **49,000** | **13,961.2** | **95.98** | **12,476.72** | **268.63** | **34,923.05** |

### 3.2 භෞතික ප්‍රගතිය

-------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව, සංශෝධිත සියයට 98 ක ඉලක්කයට සාපේක්ෂව එදිනට ලඟාකරගත් තත්‍ය ප්‍රගතිය සියයට 86 ක් ලෙස පැවතී තිබුණු නිසා තත්‍ය ප්‍රගතිය, ඉලක්කයට වඩා පසුපසින් ඇතිබව පෙන්නුම් කෙරිණි. කැළණි ගඟ ඉහළින් පාලම ඉදිකිරීම, පාෂාණ පැතිකඩ මත අනපේක්ෂිත විචලතාවයන්, පයිල් මුදුන ප්‍රතිනිර්මාණය හා තාවකාලික පාලම් වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබීම් ප්‍රමාදවීම ආදිය ව්‍යාපෘතිය ප්‍රමාදයන්ට හේතුවිය.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) මාර්ග සංවර්ධන අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් විගණන කණ්ඩායම සමඟ සිදු කළ සෝදිසි පරීක්ෂාවන්ට අනුව, කඩවත ඒ 1 අන්තර් හුවමාරුවේ වම්පස කිලෝමීටර 0+069 හා පිටත මංතිරුවේ දකුණු පස කිලෝමීටර 12+435 හි මාර්ග බාධක 4 හී පරාවර්තිත නැමෙන සුළු ප්ලාස්ටික් වලින් සකස් කළ මාර්ග ලකුණු අවම අපේක්ෂිත මට්ටම සමඟ එකඟ නොවුණි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රු. බිලියන 62.04 ක ලංසු වටිනාකම මාර්ග ඉදිකිරීමට අදාල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 31.33 කින් වැඩිවී තිබුණු බැවින් ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනොනැමීමට 2010 ඔක්තෝබර් 06 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත් එකී තීරණයට පටහැනිව ඉහත ලංසුව නැවත සලකා බලා ලංසු මිල රු. බිලියන 44.88 ක් දක්වා අඩුකිරීමෙන් පසුව 2011 නොවැම්බර් 25 වන දින එම ලංසුකරුටම පිරිනමා තිබූ බව සටහන් වී තිබුණි. ඉදිරිපත් කළ තොරතුරු අනුව, ඉංජිනේරු ඇස්තමේන්තුවල හෝ දෙවන ලංසුවේ ඇතුළත් රේට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර නොතිබියදීත් 2011 නොවැම්බර් 25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී දෙවන ලංසුව සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

(ඇ) ඉංජිනේරු ඇස්තමේන්තු අනුව, මූලික වියදම් කාණ්ඩය යටතේ මෝටර් රථ 15 ක් සහ යතුරු පැදි 08 ක් මිලදී ගැනීමට එකතුව රු. මිලියන 120.73 ක වෙන්කිරීම් කර තිබුණි. කෙසේ වෙතත් මෝටර් වාහන 21 ක් හා යතුරු පැදි 12 ක් මිලදී ගැනීමට වෙන්කිරීම රු. මිලියන 153.54 ක් දක්වා පසුව වැඩි කර තිබුණු අතර අතිරේක පිරිවැය තාවකාලික මුදලක් ලෙස වෙනත් කාණ්ඩය යටතේ ඇතුළත් කර තිබුණි.

(ඈ) වාහන මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් දරන ලද රු. මිලියන 19.88 ක් වටිනා එකතු කළ අගය මත බදු ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය. තවද, එකතු කළ අගය මත බදු ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් රු. මිලියන 6.90 ක පොලිය අයකරගෙන තිබුණු අතර එම වටිනාකම කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතියෙන් ඉල්ලුම් කර තිබුණි.

**3.4 මතභේදයට තුඩු දෙන කරුණු**

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක පීඊඩී/12 හී 8.3.9 හා 8.6 වගන්ති වලට පටහැනිව නිවාඩු සඳහා ගෙවීම්, වෛද්‍ය රක්ෂණය, ප්‍රසාද දීමනා හා වෙනත් දීමනා ඇතුළත් රු.මිලියන 6.84 ක් ව්‍යාපෘතියට අනුයුක්ත මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ට ගෙවා තිබුණි.

(ආ) ව්‍යාපෘති අරමුණු වලට සෘජු සම්බන්ධතාවයක් නොමැති ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 21.2 ක් වැය කර තිබුණි. තවද, අදාල අනුමැතිය ලබා ගැනීමකින් තොරව එම වියදම් කොන්ත්‍රාත් වැඩ වල විචලතාවයන් ලෙස සලකා තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ව්‍යාපෘතිය විසින් උපදේශකයින් පස්දෙනෙකු සේවයේ යොදවා තිබුණි. තවද, පාරිශ්‍රමික එකතුව රු. මිලියන 3.22 ක්ද රු. මිලියන 1.97 ක වාහන කුලියට ගැනීමේ ගාස්තුද සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු නමුත් ඔවුන් වෙත නිර්නේය විෂය කොන්දේසි නිකුත්කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘතියේ මෝටර් වාහන ඇණිය, කුලියට ගත් මෝටර් වාහන 03 කින් හා කොන්ත්‍රාත්කරු විසින් සපයන ලද මෝටර් වාහන 05 කින් සමන්විත විය. 2007 දෙසැම්බර් 20 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අක 33 (1) ප්‍රකාරව වාහන පහසුකම් හිමි නොමැති නිලධාරීන් වෙත මෝටර් වාහන 06 ක් වෙන් කර දී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.5 ඉඩම් අත්පත්කර ගැනීමේ හා නැවත පදිංචිකිරීමේ කටයුතු

-----------------------------------------------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් අවතැන් පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා හෙක්ටයාර 1.3286 ක ඉඩමකට වන්දි ගෙවීම සහ අත්පත්කර ගැනීම සඳහා 2014 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 1,745 ක් ව්‍යාපෘතිය වැය කර තිබුණි. තවද, 2014 දෙසැම්බර් අවසාන වන විට ව්‍යාපෘතියේ ඉඩම අත්පත්කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු නිම කිරීමට අපේක්ෂිත විය. මහාමාර්ග අදියර II යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සියයට 94 ක් නිම කර තිබුණු නමුත් 2014 දෙසැම්බර් 31 දිනට නැවත පදිංචිකිරීමේ කටයුතු සියයට 80 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 33 හී 2.2.4 හා 2.2.7 ඡේද ප්‍රකාරව ජාතික පුවත් පත් තුළින් අයදුම්පත් කැඳවීම මඟින් සේවකයින් බඳවා ගතයුතු අතර වසර තුනක් නොඉක්මවන කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්වීම් සිදුකළ යුතුය. කෙසේ වෙතත් ඉහත චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිදහස් කළ නිලධාරින් ඇතුළු ව්‍යාපෘති සේවක සාමාජිකයින් සියල්ලම තාවකාලික පදනම මත බඳවා ගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල තනතුරු 35 ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණු අතර එයින් තනතුරු 11 ක් සමාලෝචිත වර්ෂය පුරාම පුරප්පාඩු වී තිබුණි.